

කොළඹ කොටුව  ශ්‍රී සම්බුද්ධාලෝක විහාරයේ
බුද්ධ ප්‍රතිමා වහන්සේ

## බෞද්ධ ධර්ම රාජ්‍ය සංකල්පය ක්‍රියාත්මක කරන මඟ

*- නෙළුවාකන්දේ ඤාණානන්ද හිමි*

රාජ්‍ය පාලනය සඳහා බුදුරදුන් පෙන්වා දුන් දැහැමි මග රාජ්‍යයේ ප්‍රභවය පිළිබඳ සූත්‍ර දේශනාවල එන කරුණු සහ සමාජ සංවර්ධනය සඳහා වූ සංඝ රත්නයේ කාර්යභාරය පිළිබඳ විස්තර ද මෙම ලිපියට ඇතුළත්ය. පරිවෙණාධිපතිවරයෙකු සහ බාහිර කථිකාචාර්යවරයකු වන ලේඛක හිමියෝ සුප්‍රකට ධර්ම ලේඛක හිමිනමක් ද වෙති.

## මග තේරුම් ගැනීම

*- දිවියාගහ යසස්සි නා හිමි*

බොදුනුවන් අතර සුප්‍රකට ධම්මපදයෙහි ඇතුළත් ගාථා පාඨ පිළිබඳ සරල විමසුම් ඇතුළත් 'සාර්ථක ජීවිතයකට ධම්මපදයෙන්' නම් වූ විශේෂාංගය යටතේ පළවන කුඩා ලිපියකි. ප්‍රකට විද්වත් හිමිනමක් විසින් සපයනු ලබන මෙම ලිපි පෙළෙහි මෙවර ලිපියෙහි තේමාව වන්නේ නිවන් මගට පිළිපන් පුද්ගලයා ලාභ සත්කාර විෂයෙහි ගිජුවීමෙහි පවත්නා අයෝග්‍ය බවයි.

## බෞද්ධ සදුපදේශයන්හි වටිනාකම අවබෝධය පරිසරය සුරැකීමට දිරිදෙනු ඇත.

*- එස්. ඩී. කේ. මංගලිකා කුමාරි*

ස්වාභාවික පරිසරය පිළිබඳ බෞද්ධ ආකල්පය සත්වයාගේ පැවැත්ම සඳහා පාරිසරික සාධක සුරක්ෂිතව තබාගැනීමේ වැදගත්කම පිළිබඳ බුදුවදන් තුළින් හෙළිවන අදහස් රුහුණු විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ සහකාර කථිකාචාරිනියක් මෙම ලිපිය සපයයි.

## දහම් ගුරු විසි දෙදහසකට ජනවාරියේදී නිල ඇඳුම් නොමිලයේ

## සසර ගමන දිගු කරන හෝ කෙටි කරන විස්මිත සිත

*- බන්දුල උබේසිංහ*

පුද්ගලයාගේ සිත ක්‍රියාකරන ආකාරය සහ දුකින් මිදීම සඳහා එය භාවිතා කළ යුතු ආකාරය පිළිබඳ බුදුරදුන් දෙසූ පරිපූර්ණ මනෝ විග්‍රහයක් විමර්ශනයට ලක්කිරීමක් ලෙසයි මෙම ලිපිය හැඳින්විය යුතු වන්නේ.

## සදහම් දැනුම

*- වහුමුවේ විජයවංස නා හිමි*

බුදුසමය සහ ඊට අදාළ විවිධ විෂය කරුණු පිළිබඳ බුදුසරණ පාඨකයන් දැනුවත් කරන විශේෂාංගයකි. කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් මෙම විශේෂාංගය දහම හදාරණ සිසුන්ට විශේෂයෙන් ප්‍රයෝජනවත් විය හැකිය. විද්වත් ලේඛක හිමිනමක විසින් සපයනු ලබන ලිපි පෙළක තවත් එක් කොටසකි.

## නිවන් දක්නා ජාති දක්වා පාපී පුද්ගල ඇසුර නොලබමු

*- මුරුංගාගස්යායේ ඤාණිස්සර නා හිමි*

පුද්ගලයාගේ පිරිහීමට හේතුවන සමාජ බලපෑම් පිළිබඳ ඉදිරිපත් කරන ලද දේශනාවකට අර්ථකථනයක් ලෙස මෙම ලිපිය හැඳින්විය හැකිය. පවට නැඹුරු වූ නිවැරදි ජීවන දැක්මක් නොමැති පුද්ගල ඇසුර - කෙනකුගේ පරිහානියට හේතුවන අයුරු පැහැදිලි කැරෙන දේශනාවකි, මෙය. විදේශ ධර්ම ප්‍රචාරක සේවාවෙහි නිරතවන සුප්‍රකට ධර්මධර හිමිනමකි, මෙම ලිපිය සපයන්නේ.

## බුද්ධ භාෂිතයේ උතුම් වදන් විහිළුවට ලක් කරන කුමන්ත්‍රණයක්?

*- කඩවත සමින්ද හිමි*

දැන හෝ නොදැන බුද්ධ භාෂිතයේ ඇතුළත් වැදගත් අරුත් දෙන ඇතැම් වදන් - විවිධ සමාජ කොටස් තුළ අවමානයට ලක්වන අයුරින් භාවිතාවීම සහ එයින් බුද්ධ භාෂිතය පිළිබඳ පොදු සමාජය තුළ ඇති විය හැකි වැරැදි ආකල්ප සියුම් ලෙස විමසා බැලීමකි, මෙම ලිපිය.

## බෞද්ධ මූර්ති කලාවේ උසස්ම නිර්මාණය වූ බුද්ධ ප්‍රතිමාව

*- නිර්මලා අමරසිංහ*

බුදු පිළිම නෙළීම පිළිබඳ කලාවේ ඉතිහාසය මූර්ති කලාවක් වශයෙන් සහ පොදු ජනතාවගේ සිත් සතන් පුබුදු කළ නිර්මාණයක් වශයෙන් එහි ඇති ශ්‍රේෂ්ඨත්වය. ලේඛිකාව - රුහුණු විශ්ව විද්‍යාලයේ ගෞරව ශාස්ත්‍රවේදී උපාධි ලාභිනියකි.

## බෞද්ධ වත් පිළිවෙත් වලදී පුරුෂ පක්ෂය ඉදිරිපත්වීම වැදගත්

*- කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි*

'ධම්ම චින්තා' විශේෂාංගය යටතේ සුප්‍රකට විචිත්‍ර ධර්ම දේශක හිමිනමක විසින් සරල බසින් තරුණ පෙළ වෙත ඉදිරිපත් කරනු ලබන ලිපි පෙළක - තවත් එක් කුඩා ලිපියකි. බෞද්ධ වත් පිළිවෙත්වලදී ඉදිරිපත් වන සමාජ කොටස් පිළිබඳ උපදෙසකි. මෙම ලිපියට ඇතුළත් වන්නේ.

## 'This is the Rainy Season': Ayan Vassana Kalo

*-by Prof. Asanga Tilakaratne, Director Postgraduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya, Colombo*

## ඉතිහාසය - සාහිත්‍යය අමතක කළ නිසා රට ගැන දැනුමක් නැති දරුවන් බිහිවුණා

අභයගිරි ස්ථූපයෙහි සංරක්ෂණ කටයුතු ඇරඹීමේ උළෙලේදී අගමැති කළ ප්‍රකාශයක්.

## බුදු සසුන හා මහ සයුර උපමාවට ගෙන දෙසූ උපෝසථ සූත්‍රය

*- දයා අංහෙට්ටිගම*

මහා සාගරය උපමාවට ගෙන බුදුසසුන පිළිබඳ දේශනා කළ ආශ්චර්ය-ජනක කරුණු අටක් ගැන විග්‍රහයකි, මෙම ලිපිය බුදුරදුන්ගේ විශ්ම-යජනක දේශනා ශෛලිය සහ අපූර්ව ශාස්තෘත්වය ප්‍රකට කරවන තවත් එක් නිදසුනක් ලෙස මෙම දේශනාව හැඳින්විය හැකිය.

## ව්‍යවස්ථානුකූල ආගමික නිදහස වල්බුරු නිදහසක් නොවේ

*- කතුවැකිය*

## හක්බෙලිකන්ද ආරණ්‍ය සේනාසනය

*- ජනක වෙත්තසිංහ*

කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් ඉපැරැණි ආරණ්‍ය සේනාසනයක් පිළි-බඳ තොරතුරු කියැවෙන ලිපියකි. ක්‍රිස්තු පූර්ව පස් වැනි සහ හය වැනි සියවස් වලදී රහතන්වහන්සේ පවා මෙම භූමියේ වැඩ සිටි බවට ඓති-හාසික සාධක ඇතැ'යි සැලකෙන බවයි ලේඛකයා පවසන්නේ.

## රන්දෙඹේ මහා චෛතිය විහාරස්ථානය

*- පුණ්‍යසෝම සිල්වා කාලිංග*

ගාල්ල දිස්ත්‍රික්කයට අයත් බලපිටිය මැතිවරණ කොට්ඨාසයේ අම්බ-ලන්ගොඩ - ඇල්පිටිය මාර්ගය ආසන්නයේ පිහිටි පැරැණි විහාරස්ථාන-යක් පිළිබඳ තොරතුරු මෙම ලිපියෙන් ඉදිරිපත් වී ඇත. බුදු සසුනට විවිධ විදේශ ආක්‍රමණික බලපෑම් එල්ල වී තිබූ සමයක ශාසන චිරස්ථි-ථිය සඳහා සුප්‍රකට හිමිනමක් විසින් රට පුරා පිහිටවූ විහාරස්ථානවලින් එකක් ලෙසයි, මෙම විහාරය සැලකෙන්නේ.